පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර)
නොවැම්බර් / දෙසැම්බර් 2018
பொதுக் கலைத்தேர்வு (வெளிவாரி)
நவம்பர் / டிசம்பர் 2018
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL)
NOVEMBER / DECEMBER 2018

**දේශපාලන හා සමාජ න්‍යාය - PSG I**

මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **10කි.**
ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.
කාලය පැය **03ක්** පමණයි.

---

1. දේශපාලන හා සමාජ න්‍යායේ ස්වභාවය සහ එය අධ්‍යයනය කිරීමේ වැදගත්කම පරීක්ෂා කරන්න.

2. පහත සඳහන් **ඕනෑම එක් දේශපාලන සංකල්පයක** වැගත්කම සාකච්ඡා කරන්න.

   (අ) ස්වාධීපත්‍යය.
   (ආ) නිදහස.
   (ඇ) යුක්තිය.
   (ඈ) අයිතිවාසිකම්.
   (ඉ) නීතියට අනුව පාලනය කිරීම.

3. සම්භාව්‍ය ලිබරල්වාදයේ **හෝ** නව ලිබරල්වාදයේ ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න.

4. පහත සඳහන් **ඕනෑම එක් මාතෘකාවක්** පිළිබඳව විවේචනාත්මක රචනයක් ලියන්න.

   (අ) මනෝරාජික සමාජවාදය.
   (ආ) මාඕවාදය.
   (ඇ) රෝම නීතිය.

5. සමාජවාදයේ වර්ධනය සම්බන්ධයෙන් කාල් මාක්ස් විසින් කරන ලද දායකත්වය තක්සේරු කරන්න.

6. "ෆැසිස්ට්වාදය මගින් ලිබරල්වාදයේ මූලධර්ම ප්‍රතික්ෂේප කරයි", ඔබ එකග වන්නේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

අ.පි.බ.

7. පහත සඳහන් ප්‍රකාශන අතරින් **ඕනෑම එක් ප්‍රකාශනයක්** සම්බන්ධයෙන් අදහස් දක්වන්න.

(අ) ඇරිස්ටෝටල් අවධානය කර ඇති ආකාරයට ආණ්ඩුවේ අරමුණ වන්නේ පුරවැසියන්ට සත්ගුණය සහ සංතෘප්තිය අයත් කර ගැනීමට ඇති හැකියාව ඇති කිරීමයි.

(ආ) මැකියාවෙලි වනාහී නූතන දේශපාලන විද්‍යාවේ පියා වේ.

8. රාජ්‍යයේ සම්භවය සම්බන්ධයෙන් වන සමාජ සම්මුතිවාදී න්‍යාය පැහැදිලි කරන්න.

9. "අධිරාජ්‍යවාදී ධනවාදයේ ප්‍රතිඵලයක් වශයෙන් ලෙනින්වාදය පැන නැගිණි", අදහස් දක්වන්න.

10. පහත සඳහන් **ඕනෑම මාතෘකා දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) ස්ත්‍රීවාදයේ මූලික ලක්ෂණ.
(ආ) ජාතිකවාදයේ කේන්ද්‍රීය ඇගයීම්.
(ඇ) ෆේබියානු සමාජවාදයේ ස්වභාවය.
(ඈ) ශාන්ත තෝමස් ඇක්වයිනාස් සහ රාජ්‍යය.

******

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
**UNIVERSITY OF PERADENIYA**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
**தொடர் தொலைக் கல்வி நிலையம்**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර)
2018 නොවැම්බර් / දෙසැම්බර්
**பொதுக் கலைத்தேர்வு (வெளிவாரி)**
**நவம்பர் / டிசம்பர் 2018**
**GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL)**
**NOVEMBER / DECEMBER 2018**

**ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය - PSG II**

මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
කාලය පැය 03ක් පමණයි.

---

1. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දෙන ලද සර්ව ජන ඡන්ද බලය පිළිබඳව විවේචනාත්මක රචනයක් ලියන්න.

2. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ බලතල ප්‍රථම සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ බලතල සමග සංසන්දනය කරන්න.

3. ප්‍රථම සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහිව ඉදිරිපත් කරන ලද විවේචන සාකච්ඡා කරන්න.

4. "ශ්‍රී ලංකාවේ දෙවන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර සම්බන්ධතාවයේ ස්වභාවය තේරුම් ගැනීමට අපට අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමය පිළිබඳ සංකල්පය සහාය වේ" සාකච්ඡා කරන්න.

5. දෙවන සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන මූලික අයිතිවාසිකම් මොනවා ද? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඒවා ආරක්ෂා කළ හැක්කේ කෙසේ ද?

6. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ප්‍රධාන ගතිලක්ෂණ විස්තර කරන්න.

අ.පි.බ.

7. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳ රචනයක් ලියන්න.

8. 2018 වසර ශ්‍රී ලංකාවේ දේශපාලනය තුළ සුවිශේෂී සංධිස්ථානයක් ලෙසින් සැළකිය හැකි ද? ඇයි?

******

පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර)
නොවැම්බර් / දෙසැම්බර් 2018
பொதுக் கலைத்தேர்வு (வெளிவாரி)
நவம்பர் / டிசம்பர் 2018
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL)
NOVEMBER / DECEMBER 2018

රාජ්‍ය පරිපාලනය - PSG III

මෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **09කි.**
ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.
කාලය පැය **03ක්** පමණයි.

---

1. 'රාජ්‍ය පරිපාලයනය' යනු කුමක් දැයි අර්ථකථනය කොට එය පෞද්ගලික අංශයේ පරිපාලනයෙන් වෙනස් වන ආකාරය හුවා දක්වන්න.

2. රාජ්‍ය පරිපාලයනය අධ්‍යයනයෙහි ලා වුඩ්රෝ විල්සන්ගේ දායකත්වය සාකච්ඡා කරන්න.

3. මැක්ස් වෙබර් විසින් ඉදිරිපත් කළ පරමාදර්ශී නිලබල ක්‍රමයේ මූලික ලක්ෂණත් එය රාජ්‍ය පරිපාලනය කෙරෙහි බලපෑ ආකාරයත් විස්තර කරන්න.

4. 'සංවිධානය' යනු කවරේදැයි අර්ථකථනය කොට එහි මූලික ලක්ෂණ විස්තර කරන්න.

5. සංවිධානය පිළිබඳ විද්‍යාත්මක කළමනාකරණවාදී න්‍යායෙහි මූලික ලක්ෂණ පැහැදිලි කරන්න.

6. "පරිපාලන කාර්යක්ෂමතාව හා ඵලදායකත්වය සම්බන්ධව අත්‍යවශ්‍ය මූලධර්මයක් වන්නේ විමධ්‍යගතකරණයයි." සාකච්ඡා කරන්න.

7. බ්‍රිතාන්‍ය සිවිල් සේවාව ප්‍රතිසංස්කරණයෙහි ලා ඉදිරිපත් කළ නොර්ත්කොට් ට්‍රැවලියන් නිර්දේශ සාකච්ඡා කරන්න.

අ.පි.බ.

8. "ප්‍රංශය යනු පරිපාලනය කරන රාජ්‍යයකි." සාකච්ඡා කරන්න.

9. පහත සඳහන් **ඕනෑම දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. දේශපාලනය හා පරිපාලනය අතර වෙනස්කම

ii. නව රාජ්‍ය පරිපාලනය

iii. POSDCoRB සංකල්පය

iv. රාජ්‍ය පරිපාලනය දේශපාලනීකරණය

v. ශ්‍රී ලංකාවේ පළාත් පරිපාලනය

******